# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1789/43 – 2012 දෙසැම්බර් 21 වැනි සිකුරාදා – 2012.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: කො/ප්‍රා/ලේ/03/05/01/05.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොලොන්න ගම් පත්තුව සුළු කොට්ඨාසයේ, උල්ලිඳුවාව ග්‍රාම නිලධාරී වසමේ ජාතුංකන්ද ගමෙහි පිහිටි අ.ග.පි. අංක 789 දරන පිඹුරේ අතිරේක අංක 03හි පත්‍ර අංක 03 හි දැක්වෙන කැබලි අංක 271, 272, 273, 274, 275, 276, 277, 278, 279 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 15.5634 ක් පමණ වන ඉඩම් කැබලි නවය (9):

**කැබලි අංක 271**
ඉඩමේ නම: නූරි අක්කර, අබ්බෙගල, අබ්බෙගලවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: දම්පැල්ල ගමාච්චිගේ යසසිරි; ප්‍රමාණය: හෙක්. 5.5838.

**කැබලි අංක 272**
ඉඩමේ නම: අබ්බෙරොක්වත්ත, උඩ අබ්බෙරොක්; විස්තරය: -; හිමිකම් කියන අය: දම්පැල්ල ගමාච්චිගේ යසසිරි; ප්‍රමාණය: හෙක්. 1.1828.

**කැබලි අංක 273**
ඉඩමේ නම: නූරි අක්කර, අබ්බෙගල, අබ්බෙගලවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: දම්පැල්ල ගමාච්චිගේ යසසිරි; ප්‍රමාණය: හෙක්. 0.2359.

**කැබලි අංක 274**
ඉඩමේ නම: අබ්බෙරොක්වත්ත, උඩ අබ්බෙරොක්; විස්තරය: -; හිමිකම් කියන අය: දම්පැල්ල ගමාච්චිගේ යසසිරි; ප්‍රමාණය: හෙක්. 6.3056.

**කැබලි අංක 275**
ඉඩමේ නම: -; විස්තරය: -; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0177.

**කැබලි අංක 276**
ඉඩමේ නම: නූරි අක්කර, අබ්බෙගල, අබ්බෙගලවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0783.

**කැබලි අංක 277**
ඉඩමේ නම: අබ්බෙරොක්වත්ත, උඩ අබ්බෙරොක්; විස්තරය: -; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.4993.

**කැබලි අංක 278**
ඉඩමේ නම: අබ්බෙරොක්වත්ත, උඩ අබ්බෙරොක්; විස්තරය: -; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 1.0697.

**කැබලි අංක 279**
ඉඩමේ නම: අබ්බෙරොක්වත්ත, උඩ අබ්බෙරොක්; විස්තරය: -; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.5903.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 28 වැනි දින පූ. භා. 10.00 ට කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මාර්තු මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඒ. එස්. ජේ. ගොඩැල්ලවත්ත
ප්‍රාදේශීය ලේකම්,
කොලොන්න

2012 දෙසැම්බර් මස 14 වැනි දින,
කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 – 233

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළයේ බඹරගම ගමේ පිහිටි පහත විස්තර කර ඇති ඉඩම් කොටස:

1. පිඹුරු විස්තරය: අ.ග.පි. 247; පත්‍ර අංකය 35 ; අතිරේක අංකය 35

**කැබලි අංක 431 සහ 432**

ඉඩමේ නම:-; විස්තරය: කැබලි අංක 431, වත්ත, මිශ්‍ර වගාව හා ස්ථිර ගොඩනැගිල්ලක් ඇත, කැබලි අංක 432, මාර්ගය; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මස්කෙලිය වැවිලි සමාගමට බදු දී ඇත; ප්‍රමාණය: හෙක්. 4.124.

2. පිඹුරු විස්තරය: අ.ග.පි. 247; පත්‍ර අංකය 34 ; අතිරේක අංකය 34

**කැබලි අංක 427, 428, 429 සහ 430**

ඉඩමේ නම:-; විස්තරය: කැබලි අංක 427, 428, 429 - වත්ත මිශ්‍ර වගාව හා ස්ථිර ගොඩනැගිල්ලක් ඇත, 430 - වත්ත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මස්කෙලිය වැවිලි සමාගමට බදු දී ඇත; ප්‍රමාණය: හෙක්. 4.301.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 06 වැනි දින පූ. භා. 09.00 ට බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 පෙබරවාරි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ශ්‍රියානි ධම්මිකා ජයසේකර
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2012 දෙසැම්බර් මස 10 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 – 234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.